# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 87/10 — 1980 මැයි 08 වැනි බ්‍රහස්පතින්ද — 1980.05.08

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී.—බී. 21/78

උඅ/4/3/10

**1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත**

23(1) වන වගන්තිය යටතේ නියමය

උසස් අධ්‍යාපන අමාත්‍ය ජූනියස් රිචඩ් ජයවර්ධන වන මම, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 23 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විමසා, මේ නියමයෙන්, 1980 ජූලි මස 22 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි—

(I) ඉහත සඳහන් පනතේ 21 වන, 22 වන, 24 වන සහ 25 වන වගන්තිවල සඳහන් ආයතන අතුරින් යම් ආයතනයක ශිෂ්‍යයන් නොවන තැනැත්තන්ට උසස් අධ්‍යාපන පහසුකම් සලස්වා දීමේ කාර්යය සඳහා අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු විවෘත විශ්වවිද්‍යාලයක් පිහිටුවමි;

(II) ඒ විවෘත විශ්වවිද්‍යාලයට "ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය" යන නම සහ අභිධානය දෙමි; තව ද,

(III) ඒ විවෘත විශ්වවිද්‍යාලය තිබිය යුතු ස්ථානය වශයෙන් කොළඹ දක්වමි.

ජේ. ආර්. ජයවර්ධන,
උසස් අධ්‍යාපන අමාත්‍ය.

1980 මැයි මස 06 දින,
කොළඹ දී ය.

5-317


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදි

I A—ඒ 49535—3,550 (80/05)